BUSINESS ORGANIZATIONS

(Part-V)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

සමුපකාර ව්‍යාපාරය

ජාත්‍යන්තර සමුපකාර සංවිධානය, සමුපකාර ව්‍යාපාරය පහත පරිදි හඳුන්වා දී ඇත.

" සිය ආර්ථික, සාමාජීය හා සංස්කෘතික ම ය අවශ්‍යතා හා අපේක්ෂා ඉටු කර ගැනීම උදෙසා ස්වේච්ඡාවෙන් එක්සත් වූ පුද්ගලයින්ගේ ස්වාධීන සංගමයක් මෙන් ම, සාමූහික අයිතිය සහිත ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පාලනය වන ව්‍යාපාරයකි."

නිදසුන් :

- සීමාසහිත මහරගම විවිධ සේවා සමුපකාර සමිතිය
- සීමාසහිත පේෂකාර්මිකයින්ගේ සමුපකාර සමිතිය
- සීමාසහිත ධීවර සමුපකාර සමිතිය

ClassWork.LK

සමුපකාර ව්‍යාපාරයේ සුවිශේෂී ලක්ෂණ

- ස්වාධීන සංවිධානයක් වීම
- ස්වේඡාවෙන් එක් වූ පුද්ගල සමූහයක් සිටීම
- සාමාජිකයින්ගේ සාමූහික අයිතිය
- පොදු අවශ්‍යතා හා අපේක්ෂාවලින් යුතු වීම
- ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහිත ව්‍යාපාරයක් වීම
- කොටස්වල අගය වෙනස් නොවී පැවතීම (කොටසක අගය රු. 100)
- එක් සාමාජිකයෙකුට එක් ඡන්දයක් පමණක් හිමිවීම (one man one vote)
- උපයන අතිරික්තය සාමාජිකයා සමිතිය සමග කළ ගනුදෙනුවල වටිනාකම අනුව සාමාජිකයින්ට ලබා දීම
- ලාභය මූලික අරමුණ නො වීම

ClassWork.LK

1995 මැන්චෙස්ටර් සමුළු සංවිධානය විසින් ප්‍රකාශයට පත් කළ සමුපකාර ප්‍රතිපත්ති

- ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය
- ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය
- සාමාජික ආර්ථික සහභාගිත්වය
- ස්වෛරීභාවය හා නිදහස
- සමුපකාර අධ්‍යාපනය පුහුණුව හා තොරතුරු ලබා දීම
- ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සමුපකාර සමිති අතර සහයෝගීතාව
- සමාජය පිළිබඳ සැලකිලිමත් වීම

ClassWork.LK

සමුපකාර ව්‍යාපාරයේ වාසි

- සමුපකාර සමිතියක් ඇරඹීම පහසු වීම, 10 දෙනෙකු එකතු වී පහසුවෙන් හා අඩු මුදලකින් ඇරඹිය හැකි වීම

- ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම

- අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සාධාරණ මිලට සැපයීම

- විවිධ ක්ෂේත්‍රවල ව්‍යාපාරික කටයුතු කළ හැකි වීම

- අන්‍යෝන්‍ය සහයෝගයෙන් කටයුතු කිරීම

- සමිතිය උපයන අතිරික්තය සාමාජිකයින් සතු කිරීම හෙවත් අනුග්‍රාහක ප්‍රතිගෙවීම

ClassWork.LK

සමුපකාර ව්‍යාපාරයේ සීමා

- මූල්‍ය සම්පාදන මාර්ග සීමිත වීම
- සමුපකාර ප්‍රතිපත්ති මත ම පිහිටා කටයුතු කිරීමට සිදු වීම
- සීමිත කාලයක් පමණක් විවෘත ව පැවතීම
- රාජ්‍ය අංශයේ මැදිහත් වීම සිදු වීම
- ණයට භාණ්ඩ අලෙවි කිරීමක් සිදු නො වීම
- කළමනාකරණ මණ්ඩලය ඡන්දයෙන් තෝරා පත්වන නිසා බොහෝ විට කාර්යක්ෂම නො වීම

ClassWork.LK

සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය

ශ්‍රී ලංකාවේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම, 1972 අංක 5 දරණ සමුපකාර සමිති පනත යටතේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ, සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා මගින් අදාළ පළාත් සභාවේ සමුපකාර සංවර්ධන කොමසාරිස් යටතේ සිදු කෙරේ.

සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේ දී වයස අවුරුදු 18 ට වැඩි ඕනෑ ම පුද්ගලයින් 10 දෙනෙකු විසින් පහත දැක්වෙන ලියවිලි සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

- අයදුම් පත්‍රය
- අතුරු ව්‍යවස්ථාවේ පිටපත් දෙකක්
- යෝජිත ආර්ථික කටයුතුවල යෝග්‍යතාව දැක්වෙන වාර්තාවක්
- සමුපකාර සමිතිය ලියාපදිංචිය සඳහා වූ යෝජනාව සම්මත වූ මහ සභා රැස්වීමේ වාර්තාව

ClassWork.LK

- ඉල්ලුම් පත්‍රයට අත්සන් තැබූ සාමාජිකයින් සාමාජික ගාස්තු

- ගෙවන ලද බවටත්, එකී මුදල් කාරක සභාවේ භාරකාරිත්වයෙහි පවතින බවටත් කාරක සභාවේ සහතිකයක්

- සමිතිය පිහිටි ලිපිනයට ළඟා විය හැකි මාර්ගය දක්වන සටහනක්

ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ ලියවිලි සමුපකාර පනතට අනුකූල බව සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා පරීක්ෂා කිරීමෙන් අනතරුැ ව ලියාපදිංචි සහතිකය නිකුත් කෙරේ.

ClassWork.LK

<u>සමුපකාර ව්‍යාපාරයේ ප්‍රවණතා</u>

- ස්වයංසේවා වෙළෙඳසැල් අරඹීම හා වෙළෙඳසැල් නවීකරණය කිරීම

නිදසුන් :
කෝප් සිටි, කෝප් සුපර්

- නව ව්‍යාපාර ක්ෂේත්‍රවලට පිවිසීම

  නිදසුන් :
  සමුපකාර රක්ෂණය, ඉන්ධන පිරවුම්හල්

- ජංගම වෙළෙඳපොළවල් ඇරඹීම

- විද්‍යුත් ගෙවීමේ ක්‍රම භාවිත කිරීම

ClassWork.LK

සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය සඳහා ඉදිරිපත් කළ හැකි යෝජනා

- සමුපකාර විවෘත ව තබන වේලාවන් දීර්ඝ කිරීම
- ණයට භාණ්ඩ අලෙවි කිරීම සම්බන්ධ ව අවධානය යොමු කිරීම
- කළමනාකරණ මණ්ඩලය සඳහා දක්ෂ පළපුරුදු, කාර්යක්ෂම පිරිසක් තෝරා ගැනීම
- විවිධ ප්‍රවර්ධන උපක්‍රම භාවිත කිරීම
- ස්වයංසේවා වෙළෙඳසැල් තවදුරටත් ව්‍යාප්ත කිරීම
- පාරිභෝගික ආකර්ෂණය සඳහා වෙළෙඳසැල දර්ශනීය ලෙස සකස් කිරීම
- සාමාජික ප්‍රතිලාභ වැඩි කිරීම
- නව සාමාජිකයන් බඳවා ගැනීමට වැඩපිළිවෙලක් සැකසීම
- පාරිභෝගික සේවා සැපයීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම භාවිත කිරීම

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura